උරුමකරුවන්ට අයත් මෙලිටා නැමති දේපළ ද, දකුණට : ලොට් B සහ ටී. ඒ. ප්‍රනාන්දුගේ දේපළ ද, බස්නාහිරට : ලයනල් පී ද සිල්වාගේ දේපළ ද, මායිම්ව එකී අංක 2144 දරන පිඹුරට අනුව පර්චස් හතරයි දශම අටක (අ. 0, රූ. 0, පර්. 4.8) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 174/30 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. ටී. එස්. මොහොට්ටි මිය,
ප්‍රධාන කළමනාකාරිණි.

ලංකා බැංකුව,
මොරටුව අධිශ්‍රේණි ශාඛාව.

12 - 138

---

**ලංකා බැංකුව**

**1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම**

2018.10.17 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ද සිල්වා විසින් සහතික කරන ලද 2014.04.02 දිනැති අංක 4731, 2014.12.19 දිනැති අංක 4786, 2015.12.02 දිනැති අංක 4855 සහ අංක 4856 සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. වීරසූරිය විසින් සහතික කරන ලද 2017.03.01 දිනැති අංක 3348 සහ 3349 ද 2017.12.11 දිනැති අංක 3484 දරන උකස් බැඳුම්කර අනුව රුපියල් ලක්ෂ විස්සක (රු. 2,000,000.00) ස්ථිර අයිරා පහසුකම, රුපියල් දෙකෝටි පන්ලක්ෂ අසූදහසක (රු. 20,580,000.00) ප්‍රතිලේඛනගත ණය A ගිණුම සහ රුපියල් පහළොස්ලක්ෂය (රු. 1,500,000.00) ප්‍රතිලේඛනගත ණය B ගිණුම මත මුල් මුදල හා පිටහිටි පොලිය වශයෙන් පිළිවෙලින් රුපියල් විසිඑක් ලක්ෂ තුන්දහස් තුන්සිය අනූහතයි ශත විසිහය (රු. 2,103,397.26), රුපියල් දෙකෝටි විසිපන්ලක්ෂ අනූපන්දහස් අටසිය හැටයි ශත දහඅට (රු.22,595,860.18) සහ රුපියල් පහළොස් ලක්ෂ හතලිස් අටදහස් එකසිය හැටනවයයි ශත හතලිස්පහක (රු. 1,548,169.45) මුදලක් සමග එකී ස්ථිර අයිරා පහසුකම වන රුපියල් ලක්ෂ විස්ස (රු. 2,000,000.00) මත වසරකට සියයට දහහත (17%) බැගින් ද, රුපියල් දෙකෝටි පන්ලක්ෂ අසූදහසක (රු. 20,580,000.00) ප්‍රතිලේඛණගත ණය A ගිණුම මත වසරකට සියයට දහහතර (14%) බැගින් ද, රුපියල් පහළොස්ලක්ෂය (රු. 1,500,000.00) ප්‍රතිලේඛනගත ණය B ගිණුම මත වසරකට සියයට හතර (4%) බැගින් ද, 2018.09.20 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොලිය ද, කොළඹ 01, චැතම් වීදිය, 1 වැනි මහල, අංක 113 හි ඒ. එම්. කේ. ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී සමාගම වෙතින් අයවිය යුතුව ඇත.

එකී අංක 4731, 4786, 4855, 4856, 3348, 3349 සහ 3484 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු රුපියල් දෙකෝටි හැටදෙලක්ෂ හතලිස්හත් දහස් හාරසිය විසිහයයි ශත අසූනවයක (රු. 26,247,426.89) මුදල මත 2018.09.20 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3 හි වෙන්දේසිකාර ටී. ඇන්ඩ් එච් ඔක්ෂන් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, අගනුවර ශාඛාවේ කළමනාකරු (අයකර ගැනීම් හා ණය සුපරීක්ෂණ) හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**පළමු උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේපත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 526A ගංගොඩවිල දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගංගොඩවිල ග්‍රාමයේ පිහිටි දුම්රියපල පාරේ, වරිපනම් අංක 95/2 සහ 95/2, 1/1 දරන "කැටකැලගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් සාදන ලද 2013 පෙබරවාරි මස 6 දිනැති අංක 6381 දරන පිඹුරෙහි බෙදා වෙන් කරන ලද ලොට් A2, B2, C දරන, උතුරට : බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් සාදන ලද 2013 පෙබරවාරි 6 දිනැති අංක 6380 දරන පිඹුරෙහි ලොට් A2, B2, A ද, නැගෙනහිරට : එස්. ඩී. ප්‍රියන්ත උරුමකම් කියන බලයලත් මිනින්දෝරු ජේම්ස් රොඩ්රිගෝ විසින් සාදන ලද 1926 සැප්තැම්බර් 24 දිනැති අංක 2171 දරන පිඹුරෙහි ලොට් A1 ද, දකුණට : එස්. කේ. ඩී. එල්. විජේන්ද්‍ර උරුමකම් කියන බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් සාදන ලද 1990 ජනවාරි 16 දිනැති අංක 2827 දරන පිඹුරෙහි ලොට් A2B1 සහ ලොට් A2, B2, D ද බස්නාහිරට : එස්. කේ. ඩී. එල්. විජේන්ද්‍ර උරුමකම් කියන අංක 2827 දරන එකී පිඹුරෙහි ලොට් A2, B1 සහ අඩි 10 පළල දැනට පවතින පාර (බලයලත් මිනින්දෝරු ඩී. ජේ. ද සිල්වා විසින් සාදන ලද 1977 ජනවාරි 20 දිනැති අංක 691 දරන පිඹුරෙහි ලොට් A2C) ද මායිම්ව එකී අංක 6381 දරන පිඹුරට අනුව පර්චස් දහසයයි දශම පහයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 16.50) හෙවත් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි හතරයි එකයි හතයි තුනක (හෙක්ටයාර 0.04173) බිම් ප්‍රමාණය සහ ඒ තුළ පිහිටි සියලු දේ වන අතර මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A216/49 හි ලියාපදිංචි කර ඇත.

2. එකී ගංගොඩවිල ග්‍රාමයේ පිහිටි දුම්රියපල පාරේ, වරිපනම් අංක 97 දරන "කැටකැලගහවත්ත" නැමති ඉඩමේ අංක 6381 දරන එකී ඉඩමෙහි ලොට් A2, B2, D ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් A2, B2, D දරන, උතුරට : ලොට් A2, B2, C ද, නැගෙනහිරට : එස්. ඩී. ප්‍රියන්ත උරුමකම් කියන අංක 2171 දරන එකී පිඹුරෙහි ලොට් A1 ද, දකුණට : දුම්රියපල පාර ද, බස්නාහිරට : එස්. කේ. ඩී. එල්. විජේන්ද්‍ර උරුමකම් කියන එකී අංක 2827 දරන පිඹුරෙහි ලොට් A2, B1 ද මායිම්ව එකී අංක 6381 දරන පිඹුරට අනුව පර්චස් දෙකයි දශම තුනයි පහක (අ. 0, රූ. 0, පර්. 2.35) හෙවත් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි පහයි නවයයි පහක (හෙක්ටයාර 0.00595) බිම් ප්‍රමාණය සහ එය තුළ පිහිටි සියලු දේ වන අතර මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A216/50 හි ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

1. එකී ගංගොඩවිල ග්‍රාමයේ පිහිටි "කැටකැලගහවත්ත" නැමති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. ජේ. ද සිල්වා විසින් සාදන ලද 1977 ජනවාරි මස 20 දිනැති අංක 691 දරන එකී පිඹුරෙහි ලොට් A2,C ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් A2,C උතුරට : ලොට් A2,A ද, නැගෙනහිරට : ලොට් A2B ද, දකුණට : දුම්රියපල පාර ද, බස්නාහිරට : ජී. එම්ස් පෙරේරා සහ එච්. ජී. ලියනගේ උරුමකම් කියන ඉඩම ද මායිම්ව එකී අංක 691 දරන පිඹුරට අනුව පර්චස් පහයි දශම අටක (අ. 0, රූ. 0, පර්. 5.8) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේ ද වේ. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A216/43 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. එම්. එච්. ඒ. එස්. එස්. බී. ඒකනායක මයා
කළමනාකරු.
(අයකර ගැනීම් හා ණය සුපරීක්ෂණ)

2018 නොවැම්බර් මස 07 වැනි දින,
ලංකා බැංකුව,
අගනුවර ශාඛාව.

12 - 139

---

## පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - පිටකොටුව ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි.

ණුදෙනුකරුවන්ගේ නම : මොහොමඩ් හරූන් රෂීඩ් සහ මොහොමඩ් ස්මත් මොහොමඩ් සිද්දික් නූර් මොහොමඩ්.

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වර්ෂ 2018.10.31 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, ඉහත කී මොහොමඩ් හරූන් රෂීඩ් සහ මොහොමඩ් ස්මත් මොහොමඩ් සිද්දික් නූර් මොහොමඩ් යන අය "බන්ධනදායි" ලෙස ද, මොහොමඩ් හරූන් රෂීඩ් යන අය "උකස්කරු" ලෙස ද, ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එන්. රාජකරුණා විසින් සහතික කරන ලද වර්ෂ 2012.03.15 වැනි දිනැති අංක 4935 දරන ප්‍රාථමික චල උකස්කරය සහ වර්ෂ 2012.07.19 වැනි දිනැති අංක 5034 දරන ප්‍රාථමික චල උකස්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එල්. වඩුතන්ත්‍රී විසින් සහතික කරන ලද වර්ෂ 2015.02.19 වැනි දිනැති අංක 262 දරන ද්විතීයික චල උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 4935, 5034 සහ 262 දරන උකස්කරයන් මත,

වර්ෂ 2018.09.30 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් පහළොස් මිලියන අට ලක්ෂ දහතුන් දහස් එකසිය විසි දෙකයි ශත අනූ තුනක (රු. 15,813,122.93) මුදලක් ද, සහ වර්ෂ 2018.10.01 වැනි දින සිට රු. 15,350,000.00.ක මුදල දක්වා වාර්ෂිකව 17% බැගින් පොළියද, රු. 15,350,000.00ක මුදල ඉක්මවන මුදල මත වාර්ෂිකව 29% බැගින් පොළිය ද, ඉහත කී බන්ධනදායි/උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරය මත අයවිය යුතු එකී මුළු මුදල වන රුපියල් පහළොස් මිලියන අට ලක්ෂ දහතුන් දහස් එකසිය විසි දෙකයි ශත අනූ තුනක (රු. 15,813,122.93) මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසි දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද,වර්ෂ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අය කර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව කෝට්ටේ, බැද්දගාන පාර, අංක 134 හි පදිංචි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

01. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කොට්ඨාසය තුළ) සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහනගර සභාවේ, කළුබෝවිල පිහිටා ඇති කළුබෝවිල වෝඩ් අංක 4 හි ප්‍රතිබිම්බාරාම පාර, වරිපනම් අංක 17 හි පිහිටි "තෙළෙඹුගහවත්ත" යනුවෙන් හැඳින්වෙන ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ජේ. ජයවික්‍රම විසින් මැන සාදන ලද වර්ෂ 2011.08.08 දිනැති අංක 3057 දරන පිඹුරේ (බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් මැන සාදන ලද වර්ෂ 1991.06.08 වැනි දිනැති අංක 3217 දරන පිඹුරේ ලොට් 01හි නැවත මිනුමක් හා සමාන ඉඩමක් ලෙසින්) ලොට් 01 දරන ඉඩමට මායිම්, උතුරට : ප්‍රතිබිම්බාරාම පාරේ සිට ඇති පාර සහ පිඹුරු අංක 1195ඒ හි ලොට් C1 (ප්‍රතිබිම්බාරාම පාර, වරිපනම් අංක 17/10 දරන දේපළ ද), නැගෙනහිරට : පිඹුරු අංක 1195ඒ හි ලොට් C1 (ප්‍රතිබිම්බාරාම පාර, වරිපනම් අංක 17/10 දරන දේපළ) සහ පිඹුරු අංක 41 හි ලොට් L2 (ප්‍රතිබිම්බාරාම පාර, දෙවන පටුමග, වරිපනම් අංක 17/3ඒ දරන දේපළ ද), දකුණට : පිඹුරු අංක 1195ඒ හි ලොට් Y (ප්‍රතිබිම්බාරාම පාර, දෙවන පටුමග, අංක 17/2ඒ දරන දේපළ), සහ පිඹුරු අංක 1195ඒ හි ලොට් X (ප්‍රතිබිම්බාරාම පාර, වරිපනම් අංක 17/ඒ දරන දේපළ ද) සහ බස්නාහිරට : ප්‍රතිබිම්බාරාම පාර, ඉහත පිඹුරු අංක 3057 අනුව ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් තිස් නවයයි දශම හත (අ. 0, රූ. 0, පර්. 39.7) විශාලත්වයක් ඇති ඉඩම, ගොඩනැගිලි සහ එහි පිහිටි ගහකොළ, වැවිලි සහ සෑම සියලු දේද සමග වේ.

ඉහත ලොට් 01 දරන ඉඩම පහත දැක්වෙන ඉඩමේ නැවත බෙදීමකි.

02. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කොට්ඨාසය තුළ) සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහනගර සභාවේ, කළුබෝවිල පිහිටා ඇති කළුබෝවිල වෝඩ් අංක 4 හි ප්‍රතිබිම්බාරාම පාර, වරිපනම් අංක 17 හි පිහිටි "තෙළෙඹුගහවත්ත" යනුවෙන් හැඳින්වෙන ඉඩමට බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් මැන සාදන ලද වර්ෂ 1991.07.05 වැනි දිනැති අංක 3217 දරන පිඹුරේ (පිඹුරු අංක 89 හි ලොට් B ද, පිඹුරු අංක 562 හි ලොට් C2ද සහ පිඹුරු අංක 41 හි ලොට් L1 දරන කැබලි වල ඒකාබද්ධ කිරීමෙන්ද වන බලයලත් මිනින්දෝරු ඩී. ජෝයි ද සිල්වා විසින් මැන සාදන ලද වර්ෂ 1989.10.19 වැනි දිනැති අංක 2315 දරන පිඹුරේ ලොට් 01 හි නැවත මැනුමක් ද) ලොට් 01 දරන ඉඩමට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු එස්. ඩී. ලියසූරිය විසින් මැන සාදන ලද වර්ෂ 1975.11.12 වැනි දිනැති අංක 1195ඒ දරන පිඹුරේ ලොට් C1 (ප්‍රතිබිම්බාරාම පාර, වරිපනම් අංක 17/10 දරන දේපළ ද), නැගෙනහිරට : පිඹුරු අංක 1195ඒ හි ලොට් C1 (ප්‍රතිබිම්බාරාම පාර, වරිපනම් අංක 17/10 දරන දේපළ) සහ පිඹුරු අංක 41 හි ලොට් L2ද, දකුණට : පිඹුරු අංක 1195 ඒ හි ලොට් Y සහ ලොට් X (ප්‍රතිබිම්බාරාම පාර, වරිපනම් අංක 17/2ඒ දරන දේපළ ද), සහ බස්නාහිරට : ප්‍රතිබිම්බාරාම පාර ද ඉහත පිඹුරු අංක 3217ට අනුව මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් තිස් නවයයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 39.7) විශාලත්වයෙන් ඇති ඉඩම, ගොඩනැගිලි සහ එහි පිහිටි ගහකොළ, වැවිලි සහ සෑම සියලු දේද සමග වේ. ඉහත ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 28/78 හි ලියාපදිංචි කර ඇත.

ඉහත ලොට් 01 දරන ඉඩම පහත දැක්වෙන ඉඩමේ නැවත බෙදීමකි.

01. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කොට්ඨාසය තුළ) සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහනගර සභාවේ, කළුබෝවිල පිහිටා ඇති කළුබෝවිල වෝඩ් අංක 4 හි ප්‍රතිබිම්බාරාම පාර, වරිපනම් අංක 17 හි පිහිටි "තෙළෙඹුගහවත්ත" යනුවෙන් හැඳින්වෙන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජෝයි ද සිල්වා විසින් මැන සාදන ලද වර්ෂ 1989.10.19 වැනි දිනැති අංක 2315 දරන පිඹුරේ (බලයලත් මිනින්දෝරු ජේ. ඊ. වෝකර් විසින් මැන සාදන ලද වර්ෂ 1954.11.19 වැනි දිනැති පිඹුරු අංක 89 හි ලොට් B බලයලත් මිනින්දෝරු එස්. ඩී. ලියසූරිය විසින් මැන සාදන ලද වර්ෂ 1972.04.09 දිනැති පිඹුරු අංක 562 හි ලොට් C2 සහ බලයලත් මිනින්දෝරු ජේ. ඊ. වෝකර් විසින් මැන සාදන ලද වර්ෂ 1954.05.17 වැනි දිනැති පිඹුරු අංක 41 හි ලොට් L1 දරන කැබලි ඒකාබද්ධ කිරීමක් වේ.) ලොට් 01 දරන ඉඩමට මායිම්, උතුරට : අංක 1195ඒ දරන පිඹුරේ ලොට් C1 ද, නැගෙනහිරට : පිඹුරු අංක 1195ඒ හි ලොට් C1 සහ අඩි 20ක් පළල පාර (පිඹුරු අංක 1195ඒ හි ලොට් L2B) ද, දකුණට : පිඹුරු අංක 1195ඒ හි ලොට් Y සහ ලොට් X ද සහ, බස්නාහිරට : ප්‍රතිබිම්බාරාම පාර ද ඉහත කී පිඹුරු අංක 2315ට අනුව මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් තිස් නවයයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 39.7) විශාලත්වය ඇති ඉඩම, ගොඩනැගිලි සහ එහි පිහිටි ගහකොළ, වැවිලි සහ සෑම සියලු දේද සමග වේ. ඉහත ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 28/78 හි ලියාපදිංචි කර ඇත.

02. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහනගර සභාවේ, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, කඳවල අංක 543ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රත්මලාන පිහිටා ඇති කඳවල, වෝඩ් අංක 29 හි ගුවන්තොටුපල පාර, වරිපනම් අංක 118, B4 (පෙර 118 B1) පිහිටි " කඳවල එස්ටේට් (කොටසක්)" යනුවෙන් හැඳින්වෙන ඉඩමට බලයලත් මිනින්දෝරු සී. වීරසිංහ විසින් මැන සාදන ලද වර්ෂ 2008.07.07 වැනි දිනැති අංක 2444 දරන පිඹුරේ (බලයලත් මිනින්දෝරු පී. එල්. පීරිස් විසින් මැන සාදන ලද වර්ෂ 1984.08.31 වැනි දිනැති පිඹුරු අංක 2940 හි ලොට් 7 නැවත මැනීමක් වන බලයලත් මිනින්දෝරු සී. වීරසිංහ විසින් මැන සාදන ලද වර්ෂ 1987.04.04 වැනි දිනැති අංක 221 දරන පිඹුරේ දැක්වෙන ලොට් 07හි කැබලි කිරීමක් වන) ලොට් 01 දරන ඉඩමට එකී අංක 2444 දරන පිඹුර පරිදි මායිම්, උතුරට : රජයේ ඉඩම ද, නැගෙනහිරට : රජයේ ඉඩම සහ ගුවන්තොටුපල පාර, වරිපනම් අංක 118 සී දරන දේපල ද, දකුණට : ලොට් 02 සහ අඩි 10ක් පළල පාර ද සහ බස්නාහිරට : යමුනා ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩම ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම පහ (අ. 0, රූ, 0, පර්. 8.5) විශාලත්වය ඇති ඉඩම,

ගොඩනැගිලි සහ එහි පිහිටි ගහකොළ, වැවිලි සහ සෑම සියලු දේද සමග වේ. ඉහත ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 90/04හි ලියාපදිංචි කර ඇත.

පහත දක්වෙන පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම් මතින් සහ ඒ ඔස්සේ වන මාර්ග අයිතිවාසිකම් ද සමග වේ.

01. ඉහත කී කඳවල, වෝඩ් අංක 29 හි රත්මලාන, ගුවන්තොටුපල පාර, පිහිටා ඇති "කඳවල එස්ටේට් (කොටසක්)" යනුවෙන් හැඳින්වෙන ඉඩමට බලයලත් මිනින්දෝරු පී. එල්. පීරිස් විසින් මැන සාදන ලද වර්ෂ 1984.08.31 වැනි දිනැති පිඹුරු අංක 2940 හි (අඩි 15ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද) ලොට් 06 දරන ඉඩමට මායිම්, උතුරට : ලොට් 03 සහ 05 ද, නැගෙනහිරට : ලොට් 11 සහ 12 ද, දකුණට : අගල ද සහ බස්නාහිරට : පාර ද මායිම් වූ ඉහත කී පිඹුරු අංක 2940 ට අනුව ප්‍රමාණයෙන් පර්චස් පහයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 5.3) විශාලත්වය ඇති ඉඩම, ගොඩනැගිලි සහ එහි පිහිටි ගහකොළ, වැවිලි සහ සෑම සියලු දේද සමග වේ. ඉහත ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 90/05හි ලියාපදිංචි කර ඇත.

02. ඉහත කී කඳවල, වෝඩ් අංක 29 හි රත්මලාන, ගුවන්තොටුපල පාර, පිහිටා ඇති "කඳවල එස්ටේට් (කොටසක්)" යනුවෙන් හැඳින්වෙන ඉඩමට බලයලත් මිනින්දෝරු පී. එල්. පීරිස් විසින් මැන සාදන ලද වර්ෂ 1984.08.31 වැනි දිනැති පිඹුරු අංක 2940 හි (අඩි 15ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද) ලොට් 11 දරන ඉඩමට මායිම්, උතුරට : ලොට් 07 ද, නැගෙනහිරට : ලොට් 07 සහ 08 ද, දකුණට : ලොට් 12 ද සහ බස්නාහිරට : ලොට් 06, 05 සහ 04 ද මායිම් වූ ඉහත කී පිඹුරු අංක 2940 ට අනුව ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම එකක් (අ. 0, රූ. 0, පර්. 3.1) විශාලත්වය ඇති ඉඩම, ගොඩනැගිලි සහ එහි පිහිටි ගහකොළ, වැවිලි සහ සෑම සියලු දේද සමග වේ. ඉහත ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 90/06හි ලියාපදිංචි කර ඇත.

03. ඉහත කී කඳවල, වෝඩ් අංක 29 හි රත්මලාන, ගුවන්තොටුපල පාර, පිහිටා ඇති "කඳවල එස්ටේට් (කොටසක්)" යනුවෙන් හැඳින්වෙන ඉඩමට බලයලත් මිනින්දෝරු පී. එල්. පීරිස් විසින් මැන සාදන ලද වර්ෂ 1984.08.31 වැනි දිනැති පිඹුරු අංක 2940 හි (අඩි 15ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද) ලොට් 12 දරන ඉඩමට මායිම්, උතුරට : ලොට් 11, 08 සහ 10 ද, නැගෙනහිරට : ලොට් 15 ද, දකුණට : අගල ද සහ බස්නාහිරට : ලොට් 06 ද මායිම් වූ එකී පිඹුරු අංක 2940ට අනුව, ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම එකක් (අ. 0, රූ. 0, පර්. 7.1) විශාලත්වය ඇති ඉඩම, ගොඩනැගිලි සහ එහි පිහිටි ගහකොළ, වැවිලි සහ සෑම සියලු දේද සමග වේ. ඉහත ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 90/07හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
කළමණාකරු - ණය අයකර ගැනීම්.

12 - 102

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය

ණයකරුගේ සම්පූර්ණ නම : රත්නායක මුදියන්සේලාගේ චාමින්ද ප්‍රදීප් රත්නායක.
ණය අංක : 813059900001.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 මාර්තු මස 28 වැනි දින පැවැත්වීමට යෙදුණු 2018/03 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් අයුරින් විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙනුවෙන් පොලිසිය ඉදිරිපිට බකමූණ නීතිඥ ප්‍රසිද්ධ නොතාරිස් රනිල් වීරසේකර මහතා විසින් සහතික කරන ලද 2016.11.18 වැනි දින හා අංක 718 දරන උකස් ඔප්පුව ප්‍රකාර අයවිය යුතු මුදල් ගෙවීම ණයකරුවන් ලෙස හඳුන්වනු ලබන, හිඟුරක්ගොඩ, ගුවන් තොටුපල පාර, "චාමින්ද රියදුරු පාසල" යන ලිපිනයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 197415601824 හිමි රත්නායක මුදියන්සේලාගේ චාමින්ද ප්‍රදීප් රත්නායක යන අය ණය ගෙවීම පැහැරහැර ඇත. එබැවින් එකී උකස්කරය යටතේ 2017.11.23 වැනි දිනට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට අයවිය යුතු රුපියල් හතලිස් හත් ලක්ෂ තිස් නව දහස් පන්සිය අසූව (රු. 4,739,580.00) එදිනට අයවිය යුතු පොලිය රුපියල් හාරලක්ෂ හතලිස් පන් දහස් එකසිය පනහයි ශත හැත්ත අටක් (රු. 445,150.78) හා එදිනට ගාස්තු රුපියල් නවදහස් එකසිය හතලිස් තුනයි ශත හතලිස් පහක (රු. 9,143,45.00) මුදල 2017.04.28 වැනි දින සිට වෙන්දේසි දිනය දක්වා වාර්ෂිකව 18% පොලී අනුපාතිකය යටතේ අයවිය යුතු පොලියද, බදු ද, දැන්වීම් ගාස්තුද ඇතුළු වෙන්දේසි වියදම්ද සමග තවදුරටත් නීත්‍යානුකූල වියදමක් බැංකුවට අයවීමට තිබේ නම් එම මුදල්ද අයකර ගැනීම සඳහා ණයකරුවන් විසින් අංක 718 ඔප්පුව මගින් බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු ය. එම දේපළ විස්තර පහත උපලේඛනයේ දක්වේ.

තව ද, එකී උපලේඛනය මගින් විස්තරකර ඇති දේපල වෙන්දේසි කිරීමේ බලය අංක 146/3, කල්දේරා ගාර්ඩින්ස්, දුටුගැමුණු වීදිය, කොහුවල පිහිටි ඩලස් කෙලාට් වෙන්දේසිකරුවෝ (පුද්ගලික) සමාගම වෙත පවරා ඇත.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, සිංහල පත්තුවේ, සුළු කොට්ඨාසයේ සහ දැනට හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ හිඟුරක්ගොඩ කොට්ඨාස (අංක 05) නමැති ගමේ අංක 80, සාම පුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් සාදවා තමා භාරයේ තබාගෙන තිබෙන 187 වැනි අංකය දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි පෙනෙන එෆ්සීපී : පොː 132 වැනි අංකය දරන මුලික පිඹුරේ 1090

වැනි අංකය දරන බිම් කට්ටිය වශයෙන් පෙන්වා තිබෙන්නා වූ ද හෙක්ටයාර් බිංදුවයි දශම එකයි දෙකයි හයයි පහක් (හෙක්. 0.1265) විශාල හිඟුරක්දමන යනුවෙන් හඳුන්වනු ලබන රජයේ ඉඩම් කැබැල්ල වේ. උතුරට : කැබලි අංක 1086 ද, නැගෙනහිරට : කැබලි අංක 1086 සහ 1091 ද, දකුණට : කැබලි අංක 1091, 1097 සහ 1098, බස්නාහිරට : කැබලි අංක 1089 යන මායිම් තුළ පිහිටි ගහ කොළ, පළතුරු ආදී සියලු දේත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 933, නුවර පාර,
වෙදමුල්ල,
කැළණිය.

12 - 108

---

## පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - ජා-ඇල ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගණුදෙනුකරුගේ නම : කහඳවල ආරච්චිගේ දොන් සුරේෂ් ක්‍රිස්ටෝපර් ඩිලන්ත.

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වර්ෂ 2018.06.26 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, කහඳවල ආරච්චිගේ දොන් සුරේෂ් ක්‍රිස්ටෝපර් ඩිලන්ත බන්ධනදායි වශයෙන් ද ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ටී. එල්. එම්. ටී. විජේසිංහ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2016.11.24 දිනැති අංක 17 දරන උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද,

එකී අංක 17 දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂ 2018.06.06 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් පහළොස් මිලියන හාර ලක්ෂ දහ අට දහස් හයසිය පනස් අටයි ශත තිස් එකක (රු. 15,418,658.31) මුදල සහ වර්ෂ 2018.06.07 වැනි දින සිට රු. 14,664,991.33ක මුදල මත වාර්ෂිකව 20% බැගින් පොලිය පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අංක 17 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් පහළොස් මිලියන හාර ලක්ෂ දහ අට දහස් හයසිය පනස් අටයි ශත තිස් එකක (රු. 15,418,658.31) මුදල ඉහත කී දිනයේ සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද ගාස්තු ද වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ කහඳවල ආරච්චිගේ දොන් සුරේෂ් ක්‍රිස්ටෝපර් ඩිලන්ත යන අය විසින් බැංකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, මාවිල්මඩ, දුටුගැමුණු මාවත, අංක 369/1 දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය වෙත එකී වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, (මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ), ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසියා පත්තුවේ, කටුනායක- සීදුව නගර සභා සීමාව තුළ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 144ඒ - ලියනගේමුල්ල උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ලියනගේමුල්ල ග්‍රාමයේ පිහිටා ඇති 4 වන පටුමග දකුණේ, මීගමුව පාරේ, වරිපනම් අංක 42 සහ කලින් වරිපනම් අංක 40 දරන "දවටගහවත්ත, දවටගහකුරුඳුවත්ත හෙවත් බෝවලමුහන්දිරම්ගේවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට, බලයලත් මානක කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සකසන ලද වර්ෂ 2003.03.12 දිනැති අංක 2378 දරන පිඹුරෙහි ලොට් 3 යනුවෙන් නිරූපිත බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : අංක 2194 දරන පිඹුරේ ලොට් 222 ද, නැගෙනහිරට : අංක 2194 දරන පිඹුරේ ලොට් 175 ද, දකුණට : කොළඹ පාර, වරිපනම් අංක 169/14 ද සහ බස්නාහිරට : මෙහි ලොට් 2 ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහතකී අංක 2378 පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම පහයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 13.52) වූ බිම් ප්‍රමාණය සහ ඒ මත පිහිටි ගහකොළ, ගොඩනැගිලි, වැවිලි ආදී සෑම සියලු දේද සමග වේ. මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම/පත්ඉරුව H 54/141 හි ලියාපදිංචි කර ඇත.

තවද, බලයලත් මානක කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සකසන ලද වර්ෂ 2002.02.17 දිනැති අංක 2194 දරන පිඹුරෙහි ලොට් 222 වශයෙන් බෙදා වෙන් කර දක්වා ඇති (මීටර් 9ක් පළල පාරක්

සඳහා වෙන් කරන ලද) පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම මතින් සහ ඒ ඔස්සේ වන මාර්ග අයිතිවාසිකම සහ අනෙකුත් සම්බන්ධිත අයිතිවාසිකම් සමග ද වේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
කළමණාකාරිණි - අයකර ගැනීම්.

12 - 99

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී -**
**කල්මුනෙයි ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි.

ණයදෙනුකරුගේ නම : මහරොෆ් මොහොමඩ් සෆාන්.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වර්ෂ 2018 ක්වූ ඔක්තෝබර් මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, ඉහත නම් සඳහන් මහරොෆ් මොහොමඩ් සෆාන් යන අය විසින් බන්ධනදායී/උකස්කරු ලෙස ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කල්මුනෙයි ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. රකීබ් විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2018.04.24 දිනැති අංක 3128 දරන ප්‍රාථමික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද,

ඉහත කී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 3128 දරන උකස්කරය මත,

අ) වර්ෂ 2018 ක්වූ ඔක්තෝබර් මස 07 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් අයවිය යුතු රුපියල් දස මිලියන දෙලක්ෂ හතලිස් හතර දහස් දෙසිය හැත්තෑ අටයි ශත පහක (රු. 10,244,278.05) මුදලක් ද, වර්ෂ 2018 ක්වූ ඔක්තෝබර් මස 08 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රුපියල් අනූ හත් ලක්ෂ අසූපන් දහස් නවසිය හතලිස් දෙකයි ශත හතලිස් හයක් (රු. 9,785,942.46) දක්වා වූ මුදල මත වර්ෂයකට 20%ක පොලිය ද,

ආ) වර්ෂ 2018 ක්වූ ඔක්තෝබර් මස 07 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් අයවිය යුතු රුපියල් පනස් දෙලක්ෂ දහ අට දහස් නවසිය හතරයි ශත දහයක (රු. 5,218,904.10) මුදලක් ද, වර්ෂ 2018 ක්වූ ඔක්තෝබර් මස 08 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රුපියල් පනස් ලක්ෂයක් (රු. 5,000,000.00) දක්වා වූ මුදල මත වර්ෂයකට 20%ක පොලිය ද,

ඇ) වර්ෂ 2018 ක්වූ ඔක්තෝබර් මස 07 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් අයවිය යුතු රුපියල් හැට දෙලක්ෂ පනස් හත්දහස් හයසිය විසි හයයි ශත පනස් අටක් (රු. 6,257,626.58) මුදලක් ද, වර්ෂ 2018 ක්වූ ඔක්තෝබර් මස 08 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රු. 5,000,000.00ක සීමාව දක්වා වූ මුදලක් මත වර්ෂයකට 18% බැගින් වූ පොලිය ද රු. 5,000,000.00 ක සීමාව ඉක්මවූ මුදල මත වර්ෂයකට 29% බැගින් වූ පොලිය ද

ඉහත කී බන්ධනදායීගෙන්/උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරය මත අයවිය යුතු සම්පූර්ණ මුදල වන එකී රුපියල් විසි එක් මිලියන හත් ලක්ෂ විසි දහස් අටසිය අටයි ශත හැත්තෑ තුනක (රු. 21,720,808.73) මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොලිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අය කර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහනුවර, මාවිල්මඩ, දුටුගැමුණු මාවතේ, අංක 369/1 හි පදිංචි බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

**උපලේඛනය**

ශ්‍රී ලංකාවේ, නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, සමන්තුරෙයි පත්තුවේ, නවිතන්වේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නවිතන්වේලි ප්‍රාදේශීය සභා සීමාවේ, සලම්පයිකර්නි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, 12 වන ග්‍රාමයේ පිහිටි, උතුරින් : එන්. එච්. ඩී. ඒ. සතු ඉඩම සහ පල්ලි පරිශ්‍රය ද, නැගෙනහිරින් : අබුබකර් මොහොමඩ් ජවුෆර් සතු ඉඩම සහ අඩි 16ක පටුමග ද, දකුණින් : කේ. මාරියම් කන්ඩු සතු ඉඩම ද, බස්නාහිරින් : ඒ. එල්. සින්නරාජා සතු ඉඩම ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් එකයි (අ. 1, රූ. 1, පර්. 0) විශාලත්වය ඇති ඉඩම සමස්ථයක් වශයෙන් සහ එහි පිහිටි සියලු දෙය වේ.

ඉහත ඉඩම බලයලත් මිනින්දෝරු ටී. ඉලවරාසු විසින් මැන සාදන ලද 2018.03.20 දිනැති අංක 1735 දරන පිඹුරෙහි දැක්වෙන පරිදි පහත විස්තර කෙරේ.

ශ්‍රී ලංකාවේ, නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, සමන්තුරෙයි පත්තුවේ, නවිතන්වේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නවිතන්වේලි ප්‍රාදේශීය සභා සීමාවේ, සලම්පයිකර්නි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, 12 වන ග්‍රාමයේ පිහිටි, උතුරින් : අඩි පාර, පල්ලියේ උද්‍යානය සහ පාර ද, නැගෙනහිරින් : පාර ද, දකුණින් : කේ. මාරියම් කන්ඩු සතු වත්ත ද සහ දැනට ඒ. එම්. ජෆාර් සහ ජින්නා සතු ඉඩම ද, බස්නාහිරින් : දැනට ඒ. එම්. ජෆාර් සතු ඉඩම සහ එන්. එච්. ඩී. ඒ. හි ඉඩම ද, පල්ලියේ ඉඩම ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් එකයි (අ. 1, රූ. 1,) හෝ හෙක්ටයාර් 0.505857 විශාලත්වය ඇති ඉඩම සමස්ථයක් වශයෙන් සහ එහි පිහිටි සියලු දෙය වේ.

ඉහත ඉඩම කල්මුණේ ඉඩම් කාර්යාලයේ LDO/T19/86 හි ලියාපදිංචිව ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

උදිතා කොඩිකාර,
කළමනාකරු - ණය අයකර ගැනීම්.

12 - 100

---

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - පිටකොටුව ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි.

ගනුදෙනුකරුවන්ගේ නම් : මොහොමඩ් අමීන් මොහොමඩ් සබ්බීර් සහ මොහොමඩ් ස්මත් මොහොමඩ් සිද්දික් නූර් මොහොමඩ් හෙවත් ස්මත් මොහොමඩ් සිද්දික් නූර් මොහොමඩ්.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වර්ෂ 2018.10.31 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, ඉහත කී මොහොමඩ් අමීන් මොහොමඩ් සබ්බීර් සහ මොහොමඩ් ස්මත් මොහොමඩ් සිද්දික් නූර් මොහොමඩ් හෙවත් ස්මත් මොහොමඩ් සිද්දික් නූර් මොහොමඩ් යන අය "බන්ධනදායී" ලෙස ද, මොහොමඩ් අමීන් මොහොමඩ් සබ්බීර් යන අය "උකස්කරු" ලෙස ද, ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නලිනි කනේෂයෝගන් විසින් සහතික කරන ලද වර්ෂ 2006.04.05 වැනි දිනැති අංක 1156 දරන ප්‍රාථමික වල උකස්කරය වර්ෂ 2006.04.03 වැනි දිනැති අංක 1158 දරන ද්විතීයික උකස්කරය සහ වර්ෂ 2007.07.20 වැනි දිනැති අංක 1585 දරන තෘතීයික උකස්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එල්. වඩුතන්ත්‍රී විසින් සහතික කරන ලද වර්ෂ 2015.02.19 වැනි දිනැති අංක 260 දරන චාතුර්ථික උකස්කරය, වර්ෂ 2016.09.07 වැනි දිනැති අංක 425 දරන අතිරේක උකස්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වී. එන්. චන්දිමා විසින් සහතික කරන ලද වර්ෂ 2017.11.21 වැනි දිනැති අංක 642 දරන අතිරේක උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 1156, 1158, 1585, 260, 425 සහ 642 දරන උකස්කරය මත,

(i) වර්ෂ 2018.10.16 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් අට මිලියන නව ලක්ෂ හය දහස් හාරසිය හතලිස් හතයි ශත තිස් දෙකක (රු. 8,906,447.32) මුදලක් ද, සහ වර්ෂ 2018.10.17 වැනි දින සිට රුපියල් අට මිලියන තුන් ලක්ෂ අනූ අට දහස් හැත්තෑවයි ශත හැත්තෑ දෙකක් (රු. 8,398,070.72) දක්වා වූ මුදල මත වර්ෂයකට 21%ක පොළිය ද,

(ii) වර්ෂ 2018.10.16 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් පහළොස් මිලියන තිස් හය දහස් හත්සිය අටයි ශත හැට නවයක් ද (රු. 15,036,708.69), 2018.10.17 වැනි දින සිට රු. 10,944,000.00 ක මුදල දක්වා වාර්ෂිකව 17% බැගින් පොළිය ද රු. 10,944,000.00 ක මුදල ඉක්මවන මුදල මත වාර්ෂිකව 29% බැගින් පොළිය ද, ඉහත කී බන්ධනදායී/උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරය මත අයවිය යුතු සම්පූර්ණ මුදල වන එකී රුපියල් විසි තුන් මිලියන නව ලක්ෂ හතලිස් තුන් දහස් එකසිය පනස් හයයි ශත එකක (රු. 23,943,156.01) මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව කෝට්ටේ, බැද්දගාන පාර, අංක 134 හි පදිංචි බලයත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ), සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභාවේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම්

කොට්ඨාසය තුළ, පාමන්කඩ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වොඩ් අංක 45, පාමන්කඩ උතුර පිහිටා ඇති, හැව්ලොක් පාර, වරිපනම් අංක 599ඒ හි පිහිටි "අඹගහවත්ත" යනුවෙන් හැඳින්වෙන ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ත්‍යාගරාජා විසින් මැන සාදන ලද වර්ෂ 1985.05.05 දිනැති අංක 870 දරන පිඹුරේ (බලයලත් මිනින්දෝරු ඒ. එෆ්. සමීර් විසින් මැන සාදන ලද වර්ෂ 2004.07.26 වැනි දිනැති අංක 4046 දරන පිඹුරේ ලොට් 2511 දරන ඉඩම - කිරුළපන ලියාපදිංචි පිඹුරු අංක 4 හි ලොට් 10හි නැවත මැනුමක් හා අනුබෙදීමක් වේ.) ලොට් 2511 දරන ඉඩමට මායිම්, උතුරට : ලොට් 2510 ද, නැගෙනහිරට : පාර සහ ලොට් 11B (පාරක් සඳහා වෙන් කරන ලද) ද, දකුණට : හැව්ලොක් පාර ද සහ බස්නාහිරට : හැව්ලොක් පාර, වරිපනම් අංක 593 සහ ලොට් B6C ද, මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 8.20) විශාලත්වය ඇති ඉඩම ගොඩනැගිලි සහ එහි පිහිටි ගහකොළ, වැවිලි සහ සෑම සියලු දේද සමග වේ. ඉහත ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ SPE 28/122 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි

දේවිකා හල්වතුර,
කළමනාකාරිණි - ණය අයකර ගැනීම්.

12 - 101

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු. ශ.* |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … … | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) … … | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) … … | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) … … … … … … … … | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) … … … … … … … … | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)… … | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය… … … … … … … … | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය … … … … … … … | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 25 0 | 60 0 |
| III වැනි ඡේදය … … … … … … … | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) … … | 80 0 | 120 0 |
| II වැනි කොටස … … … … … … … … | 12 0 | 60 0 |
| III වැනි කොටස … … … … … … … … | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … … … | 23 0 | 60 0 |
| V වැනි කොටස … … … … … … … … | 123 0 | 60 0 |
| VI වැනි කොටස … … … … … … … … | 87 0 | 60 0 |

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2018** | | | |
| **දෙසැම්බර්** | 2018.12.07 | සිකුරාදා | 2018.11.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.12.14 | සිකුරාදා | 2018.11.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.12.21 | සිකුරාදා | 2018.12.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.12.28 | සිකුරාදා | 2018.12.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජනවාරි** | 2019.01.04 | සිකුරාදා | 2018.12.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.01.11 | සිකුරාදා | 2018.12.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.01.18 | සිකුරාදා | 2019.01.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.01.25 | සිකුරාදා | 2019.01.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2019.02.01 | සිකුරාදා | 2019.01.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.08 | සිකුරාදා | 2019.01.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.15 | සිකුරාදා | 2019.02.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.22 | සිකුරාදා | 2019.02.08 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.